**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------**

**සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 දෙසැම්බර් 28 දිනැතිව ඇති කර ගත් අංක 5915-එල්කේ දරන ණය ගිවිසුමේ 11 බී (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපාති කාලය**

**ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාව තුළ දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ප්‍රතිලාභ ලැබෙන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කාර්යයන් සංරචක 03 කින් සමන්විත වන අතර මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,949 කට සමාන එ.ජ.ඩො. මිලියන 75 ක් වූ අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබා දීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර 2022 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබූ අතර 2023 ජූනි 30 දක්වා දීර්ඝ කර ඇත.**

**1.3 මතය**

**2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය**

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ මූල්‍ය ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ලෙජර ගිණුම් නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. | එකඟ වෙමි. නිරීක්ෂණයට අනුව, අනාගතයේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | ලෙජර් ගිණුම් නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂවලට අදාළ රු. මිලියන 174 ක් වූ අයිතම තුන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගැළපුම් කර තිබුණද, එය අදාළ ලෙජර් ගිණුම්වල සටහන් කර නොතිබුණි. | 2019 සහ 2020 වර්ෂවලදී සංරචක එක සහ දෙකට අදාළව DLI සම්පූර්ණ කිරීමෙන් පසුව ලැබුණු මුදල විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව නිවැරදි කර ඇත. | අදාළ ගැළපුම් ඇතුළත් කිරීම් නිසි පරිදි සටහන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මෙම ව්‍යාපෘතිය 2022 මාර්තු 31 දින නිම කිරීමට නියමිතව තිබුණද, 2023 ජූනි දක්වා වසරකට වැඩි කාලයක් සඳහා දීර්ඝ කිරීම හේතුවෙන්, 2022 අප්‍රේල් සිට 2023 මාර්තු දක්වා කාලය සඳහා ව්‍යාපෘතිය සඳහා අතිරේක පරිපාලන පිරිවැය දරා තිබුණු බව නිරීක්ෂණය වූ අතර එය රු. මිලියන 9.7 ක් විය. එම මුදලින්, රු. මිලියන 7.5 ක් හෙවත් සියයට 78 ක් ව්‍යාපෘති කාර්යමණ්ඩලය සඳහා පුද්ගලික වැටුප් සහ අතිකාල දීමනා සඳහා ගෙවා තිබුණි. | එකඟ වෙමි. එසේ වුවද, ව්‍යාපෘතිය 2023 ජූනි දක්වා දීර්ඝ කර ඇති අතර එය ණය ගිවිසුමට අනුව අතිරේක පරිපාලන පිරිවැයක් නොවේ. | පිරිවැය කාර්යක්ෂමතාව තහවුරු කළ යුතුය. |

## 2.2 අරමුදල් උපයෝජනය කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැඳීම් ගාස්තු රු. මිලියන 115 ක් ණය දෙන ආයතනයට අනාර්ථික ලෙස ගෙවා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | සමස්ත වෙන්කිරීම් අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො. මිලියන 75ක් වූ අතර, 2022 වර්ෂයේ සිදු කිරීමට නියමිත කටයුතු සඳහා එ.ජ.ඩො. මිලියන 12.7ක ප්‍රතිපාදන එයට ඇතුළත් වී තිබුණි. රු. මිලියන 31.82ට සමාන එ.ජ.ඩො. මිලියන 0.122ක් 2022 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු අතර, එය 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනයෙන් සියයට 0.96ක් පමණක් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සියලු ඉලක්ක අපේක්ෂිත පරිදි සාක්ෂාත් කර ගැනීමට සහ ප්‍රතිපාදන අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

| සංරචකය/ ක්‍රියාකාරකම / උප ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකවරයාගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 03 - ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ සැලසුම් කිරීම සඳහා සහාය ලබා දීම | දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි, විනිවිද භාවයෙන් යුක්තව, සාධාරණ සහ කාර්යක්ෂම | (i) අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා සමෝධානික සමාජ සුභසාධන කළමනාකරණ පද්ධතිය සකස් කිරීම සඳහා 2022 අගෝස්තු 10 වැනි දින අදාළ කොන්ත්‍රාත් සමාගම සමඟ ගිවිසුමට එළඹෙන ලදී. එම ගිවිසුමට අනුව, මෙම කාර්යය 2023 අප්‍රේල් 10 | IWMS සංවර්ධන මොඩියුල සම්පූර්ණ කිරීමට පෙර පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මූලික ක්‍රියාවලිය වෙනස් විය. ආයතනය තුළ සංවර්ධනය කරන ලද පද්ධතිය භාවිතයෙන් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. පවතින පද්ධතිය IWMS වෙත සංක්‍රමණය කිරීමට සහ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසුකම් ඇති පුද්ගලයින් | අපේක්ෂිත පරිදි, සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ආකාරයෙන් සහනාධාර ලබාදීමට සුදුසු පවුල් සංඛ්‍යාවක් තෝරා ගැනීම. | වන විට අවසන් කළ යුතු අතර, ව්‍යාපෘති කාලය 2023 ජූනි 30 දිනෙන් අවසන් වීමට නියමිතය. එසේ වුවද, මෙම පරිගණක පද්ධතිය 2023 ජූනි 23 වන විටද නිම කර නොතිබුණි. | හඳුනා ගැනීම සඳහා සියලුම මොඩියුල භාවිතා කිරීමට WBB විසින් තීරණයක් ගන්නා ලදී. | |
| | (ii) රු. මිලියන 25ක් වූ මෙම කොන්ත්‍රාත්තුව සමෝධානික සමාජ සුභසාධන කළමනාකරණ පද්ධතිය (IWMS) සකස් කිරීම සඳහා පුද්ගලික සමාගමකට පිරිනමන ලදී. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව ඉදිරිපත් කර ඇති කාර්යසාධන ඇපකරය 2023 මාර්තු 31 දින කල් ඉකුත් වී ඇති අතර, එය දීර්ඝ කර නොතිබුණි. මෙම පද්ධතිය සඳහා මූල්‍ය කාර්යසාධනය රු. මිලියන 4.5 ක් හෝ 2023 ජූනි 23 දිනට මුළු කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 20 කි. | කාර්යසාධන බැඳුම්කරයට උපදේශන සේවාව අවශ්‍ය නොවේ. උපදේශන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහිද ඉහත අවශ්‍යතාවය සඳහන් කර ඇත. ඒ අනුව, EOI සහ REP යන ලේඛන දෙක ඉල්ලා සිටීමේ දී, කාර්යසාධන බැඳුම්කරයක් ඉල්ලා නොතිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව පවා කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා මූලික විශ්වසනීයත්වයේ මිනුමක් ලෙස SSNP විසින් උපදේශකවරයාගෙන් කාර්යසාධන බැඳුම්කරය ඉල්ලා සිටින ලදී. කරන ලද ඉල්ලීම මත ඔවුන් විසින් උපදේශන කාලය සඳහා එය ලබා දෙන ලදී. | ඉල්ලා සිටින පරිදි කාර්යසාධන ඇපකර ලබා ගැනීමට සහ අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |